රුහුණු මහා කතරගම දේවාලයේ ඓතිහාසික පසුබිම පිළිබඳව විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. ඒ. ගයාන් තරිඳු

සහකාර කථිකාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර

හැඳින්වීම

කතරගම දෙවිඳුන්ගේ ප්‍රධාන වාසභවනය වූ කතරගම දේවාලය ඉපැරණි රෝහණ රාජධානියේ ප්‍රථම අගනගරය වූ කාචරගාම නොහොත් කතරගම පිහිටයි. එය එකී ප්‍රදේශය පෝෂණය කරමින් ගලා බසින මැණික් නදියේ වම් ඉවුර අසබඩ පිහිටා ඇත. මෙම භූමිය බුදුන්වහන්සේ වැඩම වීමෙන් සම්භානාවට පාත්‍ර වූ භූමියකි. අනුරාධපුර රෝපිත ශ්‍රී මහාබෝධි දක්ෂිණ ශාඛාවේ අංකුරයක් දේවානම්පියතිස්ස රජු දවස කතරගම ක්ෂත්‍රියන් විසින් මෙහි රෝපණයකරන ලද බව මහාවංශයේ සඳහන් වේ (මහාවංශය,1953.19 පරි.5 ගාථාව). මෙම කරුණ මෙන් ම මංගල මහා චෛත්‍යය සහ කතරගම දෙවියන්ගේ වාස භවනය පිහිටීම හේතු කොට ගෙන දිවයිනේ බොහෝමයක් ජනතාවගේ නොමද ගෞරවයට පාත්‍ර වූ ආගමික පරිශ්‍රයක් ලෙස කතරගම ප්‍රදේශය හැඳින්විය හැකි ය.

වර්තමානයේ මෙරට වැඩිම බැතිමතුන් පිරිසක් වාර්ෂික ව පැමිණෙන දේවාලය කතරගම දේවාලය බව අවිවාදිතය. ක්‍රි. ව. 1817-1818 උඩරට කැරැල්ලේ ආරම්භක ස්ථානය හා ප්‍රධාන මර්මස්ථානය වූයේ ද කතරගම දේවාලයයි. ශතවර්ෂ ගණනාවක් පුරා පැවති මෙම දේවාලයේ ඉතිහාසය ගොඩනැංවීම රෝහණ දේශයේ පමණක් නොව සමස්ත දිවයිනේ ඉතිහාසයේ ඌනතා පූර්ණය කිරීමක් ලෙස පැහැදිළි කළ හැකිය. සමකාලීන සමාජ ක්‍රමය හා සබැඳුණු ගැටළු විවිධ අර්බුද විවිධ අවස්ථා වලදී මෙම පරිශ්‍රය කෙරෙහි ද බලපෑ අන්දම දේවාලයේ ඉතිහාසය පරික්ෂා කිරීමේ දී අවබෝධ කර ගත හැකිය.

පර්යේෂණ ගැටළුව

සමස්ත ලංකා ඉතිහාසයේ මෙන්ම ප්‍රාදේශීය වශයෙන් රෝහණයේ ඉතිහාසයේ එක් පැතිකඩක් නිරූපණය කරන කතරගම දේවාලයේ ඉතිහාසය පිළිබීදව විධිමත් අධ්‍යයනයක් සිදු නොවීම හේතු කොට ගෙන ඒ පිළිබඳ දැනුම සමාජගත නොවීම.

අධ්‍යයන අරමුණ

රෝහණ දේශයේ සංස්කෘතික ඉතිහාසයේ එක් පැතිකඩක් නිරූපණය කරන කතරගම දේවාලයේ පුද සිරිත් හා අභිචාර විධි යන විෂය ක්ෂේත්‍රයට පරිබාහිරව එහි ඓතිහාසික පසුබිම පිළිබඳ නියමිත මූලාශ්‍ර පරිශීලනයක් මගින් පළල් දෘෂ්ටි කෝණයකින් යුක්තව රෝහණ දේශයේ ඉතිහාසය ගොඩනැංවීම සහ එමගින් යම්තාක් දුරකට සමස්ත දිවයින් ඉතිහාසයේ ඌනතා සපුරමින් ප්‍රාදේශීය ඉතිහාසය ජාතික ඉතිහාසයට බද්ධ කිරීමේ බැරෑරුම් කාර්යය මෙම අධ්‍යයනයේ ප්‍රධාන ප්‍රයත්නය වේ.

අන්තර්ගතය

කතරගම දේවාලයේ ඉතිහාසය ගොඩ නැගීමේ දී එහි ආරම්භක අවධිය පිළිබීදව හියුනෙවිල්ගේ ජනශ්‍රැති එකතුවක් වූ Ethnology නම් කාණ්ඩ තුනකින් සමන්විත ග්‍රන්ථයෙන් කරුණු ලබා ගත හැකි ය (Hugh neil,1954; p 55). 18 වන ශතවර්ෂයේ දී රචනා කරන ලද කන්දමාලය නම් කාව්‍ය සංග්‍රහයේ දැක්වෙන පරිදි දුට්ඨගාමිණී අභය රජු එළාර රජුට එරෙහිව යුද්ධය ආරම්භ කරමින් කතරගම දෙවියන් ඉදිරියේ

ජයග්‍රහණය උදෙසා භාරයක් වූ බවත් ඉන් ජය ලැබූ රජු එකී භාරය ඔප්පු කරනු වස් කතරගම දෙවියන් උදෙසා මෙම ස්ථානයේ දේවාලය ඉදි කරන ලද බවත් එහි සිදහන් වේ. ජනශ්‍රැති පදනම් කර ගෙන ගොඩ නැගෙන මෙම පුවත විශ්වසනීය මූලාශ්‍රයක් ලෙස ගිණිය නොහැකි බව පෙනෙයි. එක් අතකින් මෙම පුවත රෝහණයේ දීප්තිමත් රාජ්‍ය කාලයක් සහ ශ්‍රේෂ්ඨ නායකයකුගේ කාර්යභාරයක් ලෙස හුවා දක්වනු පිණිස ඉදිරිපත් කරන ලද කරුණක් ලෙස පැහැදිලි කළ හැකිය. අනෙක් පසින් එය කතරගම දේවාලයේ පෞරාණික භාවය තහවුරු කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රයෝගයක් වශයෙන් සඳහන් කළ හැකි වේ (වාච්චගේ.2003. පිටුව 77). මින් අනතුරුව සියවස් ගණනාවක් යන තෙක් කතරගම දේවාලය පිළිබඳ විශ්වසනීය හා වැදගත් මූලාශ්‍ර ගත තොරතුරු හමු නොවේ. කතරගම කිරිවෙහෙර පරිශ්‍රයෙන් සොයා ගත් ගඩොල් වල උළු වඩුවන්ගේ ලාංඡන ක්‍රි. පූ. 1 සියවසට අයත් යැයි සැළකෙන අතර ක්‍රි.ව. 2 වන සියවසට අයත් කතරගම සෙල්ලිපිය හා ක්‍රි.ව. 5 වන සියවසට අයත් දෙටගමුව සෙල්ලිපියත් කතරගම මංගල මහා චෛත්‍යයට කරන ලද පරිත්‍යාග පිළිබඳ සිදහන් කර තිබූ මුත් දේවාලයක් පිළිබඳ සටහන් නොලැබෙන හෙයින් මේ කාල පරිච්ඡේදයට අදාලව දේවාලයේ ඉතිහාසය සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් හමු නොවේ.

ක්‍රි. ව. 11 වන සියවසේ දී රජරට චෝළ ආධිපත්‍යයට විරුද්ධව දේශීය නායකයින් විසින් රෝහණයේ පෙළ ගැසෙන අවධියේ දී කතරගම ජාතික විමුක්ති ව්‍යාපාරයේ මධ්‍යස්ථානය බවට පත්වේ. කීර්ති කුමාරයා හෙවත් පළමුවන විජයබාහු රජු විසින් ක්‍රි.ව. 1055 දී කතරගම රෝහණයේ අගනගරය බවට තෝරා ගන්නා ලද්දේය. එම වකවානුව වන විටත් රෝහණයේ ප්‍රධාන අගනගරය කතරගම වුව ද එහි ගොඩ නගන ලද කතරගම දෙවිඳුන්ගේ දේවාලයක් ගැන වාර්තා නොලැබේ.

මින් පසුව කතරගම දේවාලය පිළිබඳ ලිඛිත තොරතුරු සමකාලීන පෘතුගීසි ලේඛකයින්ගේ වාර්තාවල සඳහන් වේ. ඒ අනුව ක්‍රි.ව. 1680-1685 කාලයේ දී ගැස්පරි පිගුවෙයිරා ද සර්පේගේ අණින් පෘතුගීසීන් විසින් කතරගම දේවාලය මංකොල්ල කෑම සඳහා දරන ලද ප්‍රයත්නය පිළිබඳ වාර්තා කරයි. එහි දැක්වෙන පරිදි කතරගම දේවාලය වූයේ කන්ද මුදුනක හෙයින් එම ස්ථානය වර්තමාන වැඩහිටි කන්ද ලෙස හඳුනා ගත හැකිය (Ribeiro.1948). 1680 පසු බ්‍රිතාන්‍ය ජාතික රොබට් නොක්ස් ඔහුගේ ග්‍රන්ථයෙහි කතරගම දෙවිඳුන් පිළිබිඳ තොරතුරු දක්වයි. දිවයිනේ ගිණිකොණ දිග පිහිටි දේවාලයක් වෙත ලුණු වෙළඳාමේ පැමිණි වෙළිඳුන් විසින් කතරගම යනුවෙන් හඳුන්වන කන්දක වාසය කරන දෙවි කෙනෙකුට පුද සත්කාර කළ බව එහි දැක්වේ (Knox.1681,p.10).

මෙම අධ්‍යයනයේ දී 1780-1789 අතර කාලය තුළ බරණ ගණිතාචාර්ය විසින් රචනා කරන ලද නීලකොබෝ සංදේශය මූලාශ්‍රයක් ලෙසවැදගත් වේ. ඔහු දක්වන පරිදි කතරගම දේවාලය පිහිටා ඇත්තේ මැණික් නදිය අසබඩය. මින් පැහැදිලි වන්නේ වැඩහිටි කන්ද මුදුනෙහි වූ දේවාලය ඒ වන විට මෙම ස්ථානයේ ඉදිකර ඇති බවයි.

කතරගම දේවාලයේ ඉතිහාසය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් ලෙස 1817-1818 ජාතික විමුක්ති අරගලය පැවතුණු අවධිය සිදහන් කළ හැකිය. දේශයේ නිදහස පතා ඉංග්‍රීසි පාලනයට එරෙහිව කතරගම කේන්ද්‍රකොට ගෙන සිදු කළ පළමු ජාතික විමුක්ති අරගලය ඇරඹීමට ප්‍රථමව යුද්ධයට අධිපති දෙවියකු ලෙස සැලකූ කතරගම දෙවියන්ට පොල්වත්තේ උන්නාන්සේ ඇතුළු පිරිසක් පැමිණ තල්පතක ලියන ලද යාදින්නක් කියවා එය දේවාලයේ ඉස්තෝප්පුවේ උළු කැටයක් යට තැබූ බවත් මේ පිළිබිඳ නඩු විභාගයේ දී ප්‍රකාශ විය (තෙන්නකෝන්. 1972. 39-41 පිටු).

18-19 සියවස් වල මෙරට බැතිමතුන් අතර ජනප්‍රියව පැවති කතරගම දේව සංකල්පය පළමු ජාතික විමුක්ති අරගලය පරාජයට පත් වීමත් සමග අභාවයට පත් විය. මේ වකවානුව වන විට මෙහි ඉතිහාසය පිළිබිඳ විශ්වසනිය මූලාශ්‍ර කිහිපයක් මීගින් තොරතුරු ලබාගත හැකි ය. 1818 පසු ඉංග්‍රීසි පාලනය විසින් දියත් කරන ලද කෲර මර්දනකාරී ප්‍රතිපත්තිය හේතු කොට ගෙන ඌව වෙල්ලස්ස ප්‍රදේශ ජනශූන්‍ය ප්‍රදේශ බවට පත් වූ අතර කතරගම පරිහානියට මෙයද හේතු කාරක විය. 1817-1818 කැරැල්ලෙන් පසුව රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකරු විසින් කතරගම දේවාලයට පැමිණි අතර ඒ වන විට කතරගම දේවාලය ගරාවැටුණු හා අභාවයට ගිය ස්ථානයක් බවට පත් විය.

ක්‍රි. ව. 1819 වර්ෂය පසු 20 වන සියවස ප්‍රථම දශක තුන දක්වා කාල පරිච්ඡේදය ගත් විට කතරගම දේවාලය සම්බන්ධයෙන් සාහිත්‍ය මූලාශ්‍ර මගින් ලැබෙන තොරතුරු බොහෝය. මෙම අධ්‍යයනයේ දී ඒවා විස්තරාත්මකව හා විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරනු ලැබේ. කතරගම දේවාලයේ මෑත කාලීන ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් කාල පරිච්ඡේද දෙකක් සඳහන් කළ හැකිය.

I. 1971 සහ 1988-89 ජ.වි.පෙ. තරුණ සන්නද්ධ අරගලය හා බැඳුණු තොරතුරු

II. ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය (L.T.T.E) විසින් කතරගම ප්‍රදේශයේ සිදු කරන ලද දේශපාලන හා ත්‍රස්ත ක්‍රියාකාරකම්

සමාලෝචනය හා නිගමනය

ක්‍රි. පූ. අවධියේ සිට 20 වන සියවස දක්වා කතරගම දේවාලයේ ඉතිහාසය ගොඩ නැඟීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ කාර්ය වූයේය. විවිධ මූලාශ්‍ර උපයෝගි කරගෙන විශ්වසනීය කරුණු ඔස්සේ මෙහි ඉතිහාසය ගොඩ නැඟීම එක අතකින් යටපත් වූ ඉතිහාසය නැවත ඉස්මතු කිරීමට ලැබුණු භාග්‍යයක් ලෙස සැලකේ. කතරගම දේවාලයේ ඉතිහාසය ගොඩ නැඟීම යනු ප්‍රාදේශීය ඉතිහාසය වන රෝහණයේ ඉතිහාසය ගොඩ නගන ව්‍යාපෘතියේ තවත් එක් අඩියරක් ලෙස දැක්විය හැකිය. මහාවංශ කතුවරයා විසින් අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍ර කරගත් ඉතිහාසයක් රචනා කළ හෙයින් එහි දිවයිනේ ප්‍රාදේශීය ඉතිහාසය සටහන් නොවීය. මේ නිසා දිවයිනේ සමස්ත ඉතිහසය අංග සම්පූර්ණ භාවයෙන් යුක්තව රචනා වූ බවක් නොපෙනේ. මෙවන් ඌනතා මග හරවා ගනිමින් සමස්ත දිවයිනේ ඉතිහාසය ගොඩ නැඟීම කළ යුතු වන්නේ ය. එයට පිළියමක් ලෙස කතරගම දේවාලයේ ඉතිහාසය ඔස්සේ රෝහණ ඉතිහාසය ගොඩනිගා එය ජාතික ඉතිහාසයට බද්ධ කිරීම වැදගත් ශාස්ත්‍රීය මෙහෙවරක් ලෙස සැලකිය හැකිය.

ආශ්‍රෙය ග්‍රන්ථ

මහාවංශය, (1955). සංස්කරණය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ.

ධාතුවංශය, (1941). සංස්කරණය, මකුළුදූවේ පියරතන හිමි, කොළඹ.තෙන්නකෝන්,

විමලානන්ද. (1972). උඩරට මහ කැරැල්ල, දෙවැනි කාණ්ඩය, කොළඹ.

වාච්චගේ, සුමනසිරි. (2005). දුට්ඨගාමණී අභය මහරජ, කර්තෘගේ ප්‍රකාශනයකි.

වාච්චගේ, සුමනසිරි. (2003). කතරගම දේවාලයේ ඉතිහාසය සහ අභිචාර විධි, මාතර.

Knox, Robert, (1958). An Historical Relation of Ceylon 1681, Ceylon historical journal vol. iv, Maharagama.

Neil, Hugh. (1954/55). Ethnology vol. 1.2.3 Edited by P.E.P Deraniyagala, Colombo.

Rebeiro, Joao. (1948). The Historic Tragedy of the Island of Ceilao, Translated by Paul Pieris, Colombo.

දත්ත දායක නාමාවලිය

සරණතිස්ස හිමි, කපුගම. අවු : 47, රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක, අභිනවාරාමාධිපති 2012-6-30, ප.ව. 7.00-8.00, අභිනවාරාම විහාරය.

සෝරත හිමි, අලුත්වැව අවු : 72, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ කුලපති කතරගම කිරිවෙහෙර රජමහා විහාරාධිපති, 2012-6-22, ප.ව. 6.00-8.00, කිරිවෙහෙර රජමහා විහාරය.

රත්නායක, ටී. සොම්පාල. අවු : 73, 1975 සිට කතරගම දේවාලයේ ප්‍රධාන කපුතැන, 2012-6-30, ප.ව. 4.45-6.25, කතරගම දේවාල භූමිය

වික්‍රමසිංහ, අනුර. අවු : 55, ග්‍රාමනිළධාරී, 2012-6-22, පෙ.ව. 9.20-10.35, කතරගම නව නගරය.